**රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2018**

---------------------------------------------------

රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ හි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ කටයුතු මාර්ග හා මහාමාර්ග සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවන අතර මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරයි.ව්‍යාපෘතියේ අරමුණ දක්ෂිණ අධිවේගී මාර්ගය සහ මධ්‍යම අධිවේගී මාර්ගය සම්බන්ධ කරමින් නව අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුළින් රටේ උපායමාර්ගික හා සමාජ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමයි.

## 1.3 මතය

මාගේ මතය,ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශණයන් තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

## 1.4 මතය සඳහා පදනම

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම පාලනයට සම්බන්ධ අය සතුවේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවධානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව්කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 භෞතික කාර්ය සාධනය

## 2.1 ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද කටයුතුවල භෞතික කාර්ය සාධනය

කොටස් හතරක් යටතේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කහතුඩුව අන්තර්හුවමාරුවේ සිට පැල්මඩුල්ල දක්වා රුවන්පුර අධිවේගී මාර්ගයේ කිලෝමීටර් 73.9 ක් ඉදිකිරීමේ යෝජනාව 2016 අගෝස්තු මස 23 දින අමාත්‍යමණ්ඩලය විසින් අනුමත කර තිබුණි.අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව විසින් අධිවේගීමාර්ගයේ පළමු කොටස සඳහා වන මූල්‍ය යෝජනාව ඇගයිම සඳහා සවිස්තරාත්මක ඉංජිනේරු ඇසතමේන්තුවක් ලබාදෙන ලෙස 2018 නොවැම්බර් මස 28 වන දින ඉල්ලීමක් කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 වන විටත් එවැනි ඇස්තමේන්තුවක් ඉදිරිපත්කර නොමැති අතර එය මූල්‍ය කටයුතු සම්පාදනය හා කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම ප්‍රමාද වීමට හේතු විය.

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරන ලදී.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ලද තොරතුරුවලට අනුව, අධිවේගී මාර්ගය ඉදිකිරීම පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීමට උපදේශන සේවා සැපයීම සඳහා රුපියල් මිලියන 394.29 ක වියදමින් මාර්ග සංවර්ධන අධිකාරිය එහි අනුබද්ධ සමාගමක් සමඟ 2014 නොවැම්බර් 10 වන දින ගිවිසුමකට එළඹ තිබුණි. මැනුම් වැනි සේවාවන් සැපයීම, විමර්ෂණය, මූලික සැලසුම් සමාජ හා පාරිසරික බලපෑම් ඇගයීම සහ නැවත පදිංචිකිරීමේ කටයුතු ආදිය කොන්ත්‍රාත්තුව සඳහා ඇතුළත් විය. ශක්‍යතා අධ්‍යන වාර්තාව 2017 ජුලි 03 වන විට අවසන් කිරීමට අවශ්‍ය වුවද 2018 දෙසැම්බර් 31 වන විටත් එවැනි වාර්තාවක් ඉදිරිපත්කර නොතිබුණි. | ශක්‍යතා වාර්තා ප්‍රමාදවීම ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාද කිරීමට හේතු වේ. | ශක්‍යතා අධ්‍යන හා මූලික සැලසුම් පිළිබඳ වාර්තා 2019 ජනවාරි මාසයේදී අවසන් කර ඇත. | ප්‍රමාද වීමට හේතු විමර්ෂණය කළ යුතුය. |
| (ආ) | රුපියල් මිලියන 11.53 ක පිරිවැයකට අධිවේගී මාර්ගය ඉදිකිරීම පිළිබඳව උපදේශක විසින් සම්පූර්ණ කළ යුතු ජල විද්‍යා අධ්‍යන කොන්ත්‍රාත්තුව රුපියල් මිලියන 66.44 ක වියදමින් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවට ප්‍රදානය කර | සිවිල් වැඩ ආරම්භ කිරීමේදී ප්‍රමාදයන් සිදු විය හැකි වීම. | නිරීක්ෂණයට එකඟ වේ. කෙසේ වෙතත් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් යොමුකරන ලද මූලික ගැටළු හේතුවෙන් 2019 අගෝස්තු 31 දින වන විට ද පරිසර බලපෑම් ඇගයීම් වාර්තාව ලබාගත | සංස්ථාව සමඟ විධිමත් ගිවිසුමකට එළඹීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| ඇත. කෙසේ වෙතත් 2019 නොවැම්බර් 30 වන විටත් සංස්ථාව සමඟ විධිමත් ගිවිසුමක් අත්සන් කර හෝ අධ්‍යයන කටයුතු අවසන් කර නොතිබුණි. | | නොහැකි වූ බැවින් මෙය සවිස්තරාත්මකව නිවැරදි කළ යුතුය. | |

## 2.3 ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටළු

| **විගණන නිරීක්ෂණය** | **බලපෑම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ලද තොරතුරුවලට අනුව කහතුඩුව සිට ඉංගිරිය දක්වා වූ අධිවේගී මාර්ගයේ පළමු කොටස යටතේ රජයේ ඉඩම් කැබලි 108 ක් ඇතුළු ඉඩම් කැබලි 701 ක් අත්පත්කර ගැනීමට නියමිතව තිබුණි. ව්‍යාපෘතියේ ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු 2016 නොවැම්බර් 01 දින ආරම්භ කර තිබුණද වන්දිගෙවීම සඳහා වූ මූල්‍ය විධිවිධාන සකසා නොතිබීම හේතුවෙන් ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වී තිබුණි. | වන්දි සඳහා හිමිකම් පියවීම ප්‍රමාද වීම මත පොලියක් දැරීමට ඇති හැකියාව. | ව්‍යාපෘතිය විසින් සකස්කරන ලද වන්දි යෝජනා ක්‍රමය 2017 මාර්තු 01 දින රජයේ ගැසට් නිවේදනයෙහි එළ කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත යොමුකළද එළවී නොමැත. | ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. |

## 2.4 පාරිසරික කරුණු පිළිබඳ ගැටළු

| **විගණන නිරීක්ෂණය** | **බලපෑම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට පෙර මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර බලපෑම් ඇගයීම් වාර්තාවක් ලබාගත යුතුය. එසේ වුවත් ව්‍යාපෘතිය මඟින් මූලික සැලසුම් සකස් කිරීම සහ | ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද විය හැකි වීම. | මේ වන විට සමස්ථ මාර්ග පථයෙහිම මිනුම් කටයුතු අවසන් කර ඇත. | ප්‍රමාද වීමට හේතු හඳුනා ගෙන වාර්තා වේගවත් කිරීම සඳහා අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. |

ඉඩම් අත්පත් කර ගැනීම ආදී කටයුතු ආරම්භ කර අදාල තොරතුරු 2018 මාර්තු මාසයේදී මධ්‍යම පරිසර අධිකාරියට ඉදිරිපත් කර තිබුණද 2019 නොවැම්බර් 30 දින වන විටත් අදාල වාර්තාව ලබාගෙන නොතිබුණි.

## 2.5 පද්ධතිය හා පාලන

පහත නිරීක්ෂණයන් කරන ලදී.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු සක්‍රියව ක්‍රියාත්මක නොවුවද, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් මෝටර් රථ 05 ක් කුලියට ගෙන වසරක ධාවන ධාරිතාවය ලෙස එකඟ වූ අවම දුර භාවිතා නොකර සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රුපියල් මිලියන 8.81 ක කුලි ගාස්තු ගෙවා තිබුණි. | ව්‍යාපෘති අධීක්ෂණ වියදම් අනවශ්‍ය ලෙස වැඩිවීම. | ප්‍රතිචාර දක්වා නොමැත. | මෝටර් රථ භාවිතා කිරීමේදී සැබෑ අවශ්‍යතාවය හඳුනාගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 ජනවාරි 15 දිනැති අංක ඩී.එම්.එස්/7777/ආර්.ඊ.පී ලිපියට සහ 2016 මාර්තු 24 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 හි 2.2.8 වගන්තිය යටතේ වූ විධිවිධාන වලට පටහැනිව ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් 2017 අප්‍රේල් 05 දින සිට සමාජ හා පාරිසරික අනුකූලතා | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවේ. | ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2017 අප්‍රේල් 01 දින මෙම උපදේශකයන් බඳවා ගන්නා ලදී. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට පියවර ගත යුතුය. |

නිලධාරියෙකු සහ ඉඩම් අත්පත්කර ගැනීමේ නිලධාරීන් යොදවා තිබු බව නිරීක්ෂණය විය. තවද 2018 දෙසැම්බර් 31 දින දක්වා රුපියල් මිලියන 1.59 ක වේතන ගෙවා තිබුණි.